# නැගෙනහිර පලාත් ජලසම්පාදන හා සංවර්ධන ව්‍යාපෘතිය ( ණය අංක එස්එල්පී 98) 2010

-----------------------------------------------------------------------------------------------

## 1. මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කයාකාරත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

( ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2 . <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2.1 <u>මූල්‍ය කාර්ය සාධනය</u>

මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබා ගත හැකි වූ තොරතුරු වලට අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම කෙර්ගෙන යන වැඩ ලෙස රු.13,190,326 ක් දරා තිබුණි.

## 3 විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කෙරේ.

අ) 2010 ජුනි 28 දිනැති ව්‍යාපෘති අවබෝධතාවයේ 4 වගන්තියේ 6 වන ඇමුණුම අනුව ජා.ජ.ස.ම.ව්‍යාපෘතිය වෙනුවෙන් වෙනමම ගිණුම් පවත්වාගත යුතුය. කෙසේ වුවද 2010 වර්ෂය තුළ ව්‍යාපෘතිය වෙනුවෙන් වෙනම ගිණුම් පවත්වා නොතිබුණි.

ආ) ජා.ජ.ස.ම. හා ශ්‍රී ලං.ර අතර උප මූල්‍යය ගිවිසුමක් 2012 ජුනි 30 දින වන විටත් අත්සන් කර නොතිබුණි.

ඇ) දේශීය අරමුදලින් ඉදිකිරීම් වැඩ වෙනුවෙන් 2010 වර්ෂයේ දී දරන ලද රු. 2,589,341 ක වියදමක් අ ජා ස නි වෙතින් ප්‍රතිපූරණය කර ගැනීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබුණි.

ඈ) ව්‍යාපෘති ගිණුම් උපචිත පදනම මත පිළියෙල කර තිබූ නමුත් විගණන සෝදිසි පරීක්ෂාවේ දී රු. 1,288,302 ක ගෙවිය යුතු මුදලක් ගිණුම්ගත කර නොතිබූ බව හෙළිදරව් විය.

ඉ) ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය විසින් සැපයූ තොරතුරු අනුව දේශීය අරමුදලින් රු.මිලියන 10 ක් මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ලබා දී තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති ගිණුම් අනුව එය රු.මිලියන 7.03 ක් පමණක් වූ අතර ඉතිරි මුදල් පිළිබඳ ගිණුම්වලින් හෙළිදරව් කර නොතිබුණි.

3.1 <u>අරමුදල් උපයෝජනය</u>

ලබා දී තිබූ තොරතුරු අනුව 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

| | අ ජා ස නි ණය | අ ජා ස නි ප්‍රදාන | ශ්‍රී.ල.ර. | එකතුව |
|---|---|---|---|---|
| එකඟ වූ දායකත්වය ( ජපන් යෙන් වලින් ) | 1,035 | 3,105 | 990 | 5,130 |
| 2010 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘති වියදම ( ජපන් යෙන් වලින් ) | 0.875 | 2.625 | 5.5 | 9 |
| අරමුදල් උපයෝජනය ප්‍රතිශතයක් ලෙස | 0.08% | 0.08% | 0.55% | 0.17% |

3.2 <u>භෞතික කාර්ය සාධනය</u>

2013 දෙසැම්බර් වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට සැළසුම් කර තිබුණි. ව්‍යාපෘතිය විසින් පිළියෙල කරන ලද ප්‍රගති වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ සමස්ථ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 26.91% හා 0.17%ක් විය. කෙසේ වුවද 2010 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘති කාලයෙන් 18.18% ක් අවසන් වී තිබුණි.